2019

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

வருடாந்த செயற்றிறன் அறிக்கை

Annual Performance Report



රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

அரசாங்க தகவல் திணைக்களம்

Department of Government Information

වාර්ෂික කාර්ය සාධන වාර්තාව

2019

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

නො.163, කිරුළපන මාවත,

පොල්හේන්ගොඩ,

කොළඹ 05.

2019 වර්ෂය සඳහා වාර්ෂික කාර්ය සාධන වාර්තාව

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

වැය ශීර්ෂ අංකය :210

අන්තර්ගතය

	පටුන	පිටුව
පරිච්ඡේදය 01 -	ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය	1 - 12
පරිච්ඡේදය 02 -	ප්‍රගතිය හා ඉදිරි දැක්ම	13 - 22
පරිච්ඡේදය 03-	වසරේ සමස්ථ මූල්‍ය කාර්ය සාධනය	23 - 43
පරිච්ඡේදය 04-	කාර්ය සාධන දර්ශක	44 - 45
පරිච්ඡේදය 05 -	තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය	46 - 48
පරිච්ඡේදය 06 -	මානව සම්පත් පැතිකඩ	49 - 52
පරිච්ඡේදය 07-	අනුකූලතා වාර්තාව	53–66
	අවසානය	67 - 68

01 පරිච්ඡේදය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

ආයතනික පැතිකඩ / ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

1.3. ප්‍රධාන කාර්යයන්

1.4. සංවිධාන සටහන

1.5. අමාත්‍යාංශ යටතේ පවතින දෙපාර්තමේන්තු/ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ පවතින ප්‍රාදේශීය ලේකම් කාර්යාල

1.6. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු (තිබේ නම්)

අ). ව්‍යාපෘතිය

ආ). දායක නියෝජිතායතනය

ඇ). ව්‍යාපෘතියේ ඇස්තමේන්තු ගත වියදම - රු.මි.

ඈ). ව්‍යාපෘති කාල සීමාව

1.1. හැඳින්වීම

බ්‍රිතාන්‍ය
යටත්විජිතවාදීපාලනසමයේදෙවනලෝකයුද්ධකාලපරිච්ඡේදයේදීයුදතොරතුරුපිළිබඳවජනතාවදැ
නුවත්කිරීමසඳහා“War Information Centre” ක්‍රියාත්මකවිය.

ලෝකයුද්ධයනිමාවීමත්සමඟඑමයුධතොරතුරුලබාදීමේමධ්‍යස්ථානය,රජයේසංවර්ධනකා
ර්යභාරයපිළිබඳවජනතාවදැනුවත්කිරීමසඳහා“රජයේප්‍රවෘත්තිදෙපාර්තමේන්තුව”නමින්අලුත්ආය
තනයක්ලෙසස්ථාපිතකිරීමටපියවරගෙනතිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස 1948 ජූලි මස 31 වැනිදා
සෝල්බරි කොමිෂන් සභාවේ උපදෙස් හා නිර්දේශ මත කොළඹ ගාලු මුවදොර මහලේකම්
කාර්යාල සංකීර්ණයේ පළමු වතාවට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදි.
ආරම්භයේදී රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,

1. ප්‍රවෘත්ති සැපයීම් අංශය
2. ආණ්ඩුවේ පොත්පත් ආයතනය සහ
3. ආණ්ඩුවේ චිත්‍රපට අංශය යන අංශ තුනෙන් සමන්විත විය.

මේ අනුව
රජයඉටුකරනුලබනජාතිකසංවර්ධනකාර්යභාරයජනතාවඅතරටගෙනයාමසඳහාප්‍රධානකාර්යය
න්තුනක්මුල්කරගෙන,ප්‍රධානඅංශතුනක්යටතේස්ථාපිතකලරජයේප්‍රවෘත්තිදෙපාර්තමේන්තුවේආය
තනව්‍යුහයබවටපත්වූයේ,

01. රජයේසංවර්ධනප්‍රවෘත්ති හා ප්‍රචාරක කටයුතු මෙහෙයවීම
02. රජයේප්‍රකාශනකාර්යාංශයමඟින්රජයේනිලප්‍රකාශනජනතාවඅතරටගෙනයාම
(මුද්‍රණයකිරීමහාබෙදාහැරීම)
03. රජයවිසින්ඉටුකරනුලබනජාතිකසංවර්ධනකාර්යභාරයපිළිබඳවගම්මට්ට
මින්ජනතාවදැනුවත්කිරීමසඳහාරජයේචිත්‍රපටඅංශයමඟින්වාර්තාචිත්‍රපටනිපදවාප්‍රද
ර්ශනයකිරීම

ගාලු මුවදොර මහලේකම් කාර්යාල සංකීර්ණයේ සිට ආයතනයේ එක්, එක් අංශ වරින්වර,
තැනින් තැන ස්ථාපිත කර තිබේ. ඒ අතර ජාවත්ත වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,

මොරටුව පොල්වත්තේ වෙලෝනා ගොඩනැගිල්ල, කොටුව ට්‍රාන්ස්වර්ක් මන්දිරය, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත - අතපත්තු ගොඩනැගිල්ල දැක්විය හැකිය. 90 දශකයේ දී කොල්ලුපිටිය පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකක පවත්වාගෙන ගිය දෙපාර්තමේන්තුව එවකට රජයේ චිත්‍රපට අංශය පවත්වා ගෙන ගිය පොල්හේන්ගොඩ පරිශ්‍රයට ගෙනැවිත් තිබේ. එතැන් සිට එම පරිශ්‍රයේ නව ගොඩනැගිලි ඉදිකරමින් ආයතනයේ විවිධ අංශ එකම පරිශ්‍රයකට ගෙන ඒමට ආයතන ප්‍රධානීන් කටයුතු කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස මනා සේවයක් ඉටුකිරීම සඳහා කාර්ය මණ්ඩලයට ලබා දෙන ත්‍යාගයක් ලෙස එම පරිශ්‍රයේම ආයතනයේ යටිතල පහසුකම් සවිමත් කරමින් ඉදිකරන ලද පස් මහළින් සැදි නව මාධ්‍ය සංවර්ධන මධ්‍යස්ථානයට 2012 මාර්තු 30 වැනිදා සුභ මොහොතින් ගෙවදින ලදි.

වර්තමානයේ රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් ධුරය දක්වා ආයතන ප්‍රධානියාගේ තත්වය උසස් වී ඇති නමුත් ආරම්භයේදී එම තනතුර ප්‍රවෘත්ත්‍යාධිකාරී නම් විය. 1948 ආරම්භක ප්‍රවෘත්ත්‍යාධිකාරී වූයේ පී.නඩේශන් මහතාය. ප්‍රවෘත්ත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ හා ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් දක්වා ආයතන ප්‍රධානී තනතුර උසස් වී තිබේ.

මෙකී කාර්යභාරය ඉටුකිරීමසඳහාපළපුරුදු,
දක්ෂජනමාධ්‍යවේදියෙකුමෙන්මපුවත්පත්කතුවරයෙකුවූඑච්.ඒ.ජේ.හුළඟල්ලමහතාරජයේප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේප්‍රධානප්‍රවෘත්තිනිලධාරියාලෙසපත්කරනුලැබීය.එසේම සහකාරප්‍රවෘත්තිනිලධාරින්ලෙසපී.එන්.මැද්දේගොඩ,එල්.ආර්.ගුණතිලක,එස්.පී.වෙත්තසිංහ,පී.බී. විජේසිංහයනමහත්වරුන්කටයුතුකරතිබේ.

ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ප්‍රකාශයක් වන "දෙසතිය" සඟරාව මුද්‍රණද්වාරයෙන් එලිදැක්වීම එවකට රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම්ධුරය දැරූ ජ්‍යෙෂ්ඨ අමාත්‍ය, ආචාර්ය සරත් අමුණුගම මහතාගේ සංකල්පයක් මත 1978 පෙබරවාරි 4 වැනිදා "දෙසතිය" සඟරාවේ මංගල කලාපය නිකුත් කිරීමත් සමග ආරම්භ වන්නේ ශ්‍රී ලාංකේය ජනසන්නිවේදන මාධ්‍යයේ හැරවුම් ලක්ෂයක් ලෙසය. එය යුග ගණනාවක් පසු කරමින් තීරණාත්මක සන්ධිස්ථාන පසුකර අඛණ්ඩව ජන මනස පෝෂණය කරමින් සිටින මුද්‍රිත මාධ්‍යයකි.

"සක්වල අතැඹුලක්" කළ දෙසතිය විසින් පෝෂණය වූ ලේඛක පරම්පරාවන් බොහෝය. පාඨක පරම්පරාව ද බොහෝය. මෙරට ප්‍රතිපත්ති තීන්දු කරන්නාගේ සිට ගොවියා, කම්කරුවා දක්වා නියෝජනය කරන ශ්‍රී ලංකාවේ රාජ්‍ය අංශයෙන් ක්‍රියාත්මක කළ එකම පුවත් සඟරාව වන්නේ ද "දෙසතිය" යි. විශේෂයෙන්ම රජයේ ප්‍රතිපත්ති, සංවර්ධන වැඩපිළිවෙල ජනතාගත කිරීමේ ප්‍රධාන වගකීම උරට ගත් දෙසතිය ඉන් ඔබ්බට ගොස් ජන මනසේ බුද්ධිමය විප්ලවයක් ඇති කිරීමට සමත්

වෙයි. සමාජීය, ආර්ථික, සංස්කෘතික, කලා, ජාත්‍යන්තර සහ තවත් බොහෝ ක්ෂේත්‍රයන් පිළිබඳ තොරතුරු ඉතාමත් සරල බස් වහරක් යොදා ගනිමින් පාඨක රුචිය වඩවන ලෙස ඉදිරිපත් කිරීමට දෙසතිය සඟරාව සමත් වී තිබේ.

දෙසතියට අමතරව "තොරතුරු" නමින් සතිපතා පුවත්පතක් ද, "Alliance" නමින් ඉංග්‍රීසි පුවත්පතක් ද එකල පල කර තිබේ.

ඉතා සුළු කාර්යමණ්ඩලයක්යටතේආරම්භකළරජයේප්‍රවෘත්තිදෙපාර්තමේන්තුවේ 2019 වර්ෂය අවසානය වන විට ස්ථීර, කොන්ත්‍රාත් හා දෛනික සේවාවන්හි නිරතව සිටින සේවක සංඛ්‍යාව 235ක් විය.

රජයේ ආයතන අතර ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව සුවිශේෂී වැදගත්කමක් දරන ආයතනයක් වන්නේ එය සෘජුවම මහජනතාවට පුවත් සපයන මාධ්‍ය ආයතන සමඟ සම්බන්ධ වන ආයතනය වන බැවිනි. ඉන් නිකුත් කෙරෙන නිවේදනයක් රජයේ නිවේදනයක් වන්නා සේම එය අතිශයින් නිවැරදි තොරතුරුවලින් සමන්විත විය යුතුමය.

එසේ පුවත් සපයන අතර එක්, එක් වකවානුවලදී රජය ගන්නා තීරණ අනුව කටයුතු කිරීමට ද සිදු වී ඇත. 1979, 1980, 1981, 1983,1987,1995,1996 හා 2000 යන වර්ෂවලදී රජය පුවත් වාරණය සිදු කළ අතර එම අවස්ථාවල රටේ කලබලකාරී වාතාවරණයක් පැවතීම ඊට හේතු විය. එවැනි අවස්ථාවලදී පුවත් වාරණය කිරීම රජයේ නිසි බලධරයා ලෙස ප්‍රවෘත්ති අධ්‍යක්ෂවරයාට පැවරුණු රාජකාරියක් විය.

1993 දී රූපවාහිනී නාලිකාවන්ට ප්‍රථම වරට ප්‍රවෘත්ති ප්‍රචාරය කිරීමට රජය අවසරදීම මෙරට මාධ්‍ය ඉතිහාසයේ වැදගත් සිදුවීමක් ලෙස සැලකිය හැකි වේ. මීට සමගාමීව මහජනයාට අවශ්‍ය තොරතුරු පහසුවෙන් ලබා ගැනීම සඳහා 1995 මැයි 18 වැනිදා ජාතික තොරතුරු මධ්‍යස්ථානය බිහි කිරීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ තවත් එක් ඉදිරි පියවරක් විය. එම මධ්‍යස්ථානය කොළඹ කොටුව, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයේ ආරම්භ කෙරිණි. ඒ සමඟම මාධ්‍යවේදීන් අතර සුහදත්වය වර්ධනය කිරීම සඳහා "Press Club" එහි පිහිටුවන ලදි.

ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරයෙන් දෙපාර්තමේන්තුව හදිසියේ ඉවත් කරන ලද අතර පසුව කොල්ලුපිටියේ පෞද්ගලික ගොඩනැගිල්ලක මහල් දෙකකට ආයතනය ගෙන ගොස් තිබේ.

රාජ්‍යජනමාධ්‍යව්‍යුහයේපැවැතිසීමාකම්හඳුනාගෙනජනතාවවඩාත්සංවර්ධනකාර්යභාරයට දායකකරගැනීමරජයේඅරමුණුවූයෙන්,විශේෂයෙන්රජයේකෘෂිකාර්මිකනවෝදය,ප්‍රජාතන්ත්‍රවාදය ශක්තිමත්කිරීම,සර්වජනඡන්දබලයේජනතාමෙහෙවරයනාදීකරුණුපිළිබඳවජනතාවදැනුවත්කිරී

මේදීරජයේප්‍රවෘත්තිදෙපාර්තමේන්තුවටපැවරුණුවගකීම්වඩාත්සාර්ථකවඉටුකිරීමටරජයේචිත්‍රපට අංශය,ප්‍රකාශනකාර්යාංශයඉතා පුළුල්මෙහෙවරක්එදායුගයේදීඉටුකරනිබේ.

ආරම්භකයුගයේසිටමරජයේප්‍රචාරනවැඩපිළිවෙළදේශීයවශයෙන්පමණක්නොවජාත්‍යන්තරවශයෙන්දඉටුකළරජයේප්‍රවෘත්තිදෙපාර්තමේන්තුවශ්‍රීලංකාවේවිදේශතානාපතිකාර්යාලඉලක්කකරගෙනඅත්පත්‍රිකා,සඟරාහාප්‍රකාශනනිතිපතාබෙදාහැරීමටදකටයුතුකරනිබේ. මෙමකාලපරිච්ඡේදයේදීවිදේශතානාපතිකාර්යාලඉලක්කකරගෙනපළකරනුලැබූ“Week Happening in the Island” සඟරාවද “Introduction Ceylon” ආදීප්‍රකාශනතුළින්ශ්‍රීලංකාවපිළිබඳවවිශේෂතොරතුරුවිදේශරටවලටලබාදීමටකටයුතුකරනිබේ. පසු කාලයේදී ශ්‍රී ලංකාව පිළිබඳ තොරතුරු විදේශයන්හි ප්‍රචාරය කිරීම සඳහා “Sri Lanka Today” නමින් තෛමාසික සඟරාවක් ද පළ කර තිබේ.

රජයේප්‍රකාශනකාර්යාංශයදඉතාපුළුල්අරමුණක්යටතේපවත්වාගෙනයමින්රජයේනිලප්‍රකාශනපිළිබඳවනීති,අණපනත්මහජනතාවටමිලදීගැනීමසඳහාමුද්‍රණයකරබෙදාහැරීමටකටයුතුකරතිබේ. මෙහිආරම්භකනිලධාරියාලෙසසේවයකරඇත්තේ R.V.H.Vantwestමහතාය.

ජූලියෝපෙට්ට්‍රෝනිමහතාගෙන්ආරම්භවූරජයේචිත්‍රපටඅංශය,නිදහසින්පසුමෙරටසිදුවූජාතිකසංවර්ධනයපිළිබඳවමහජනතාවදැනුවත්කිරීමසඳහා සුවිශාල මෙහෙවරක් ඉටු කර ඇත. ඒ වාර්තාචිත්‍රපට නිෂ්පාදනය මගිනි. පසුකාලීනවකීර්තිමත්වාර්තාචිත්‍රපටඅධ්‍යක්ෂවරුන්රාශියක්බිහිකළමෙමඅංශය,පැරිස්ජාත්‍යන්තරචිත්‍රපටඋළෙලආදීවිදේශසිනමාසම්මානඋළෙලවල්රාශියකදීවාර්තාහාඅර්ධවාර්තාඅංශයෙන්ශ්‍රීලංකාවටසම්මානදිනාදී ඇත.

1948 නිදහසත් සමඟ ඇති කරන ලද දෙපාර්තමේන්තු ආකෘතිය යටතේ යාවැකි උපරිමය දක්වා යන, සිය ගමන් මගේ එදාට වඩා පසුගිය වර්ෂවල නවීන ලෝකයට ගැලපෙන ආකාරයෙන් සංවිධිත වී ඇති රජයේ ප්‍රවාත්ති දෙපාර්තමේන්තුව 2019 වන විට අංශ කිහිපයකින් සිය සේවාවන් පවත්වා ගෙන යනු ලැබේ. රජයේ චිත්‍රපට අංශය, ඡායාරූප අංශය, සංවර්ධන අංශය, දෙසතිය සඟරා අංශය, නව මාධ්‍ය ඒකකය (www.news.lk), රජයේ ප්‍රකාශන කාර්යාංශය, මාධ්‍ය හැඳුනුම්පත් අංශය, ප්‍රචාරක අංශය සහ පර්යේෂණ හා විමර්ශන අංශවලින් සමන්විත ප්‍රකාශන හා ප්‍රචාරක අංශයන්ගෙන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී ආයතනයක් බවට මේ වන විට පත් වී ඇත.

මෙම කාර්යභාරය කාලීන වෙනස්කම්වලට ලක් වෙමින් වර්තමානය දක්වාම සාර්ථකව ක්‍රියාත්මක කිරීමට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යුහුසුළු වනවාක් මෙන්ම පවත්නා යාන්ත්‍රණයන් තුළින් ඒ සඳහා ඉඩ හසර වෙන් කර ගන්නා බවද නිරීක්ෂණයේදී පැහැදිලි වේ.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් .....

1948 සිට රජයේ ප්‍රවාත්ති දෙපාර්තමේන්තුවේ ආයතන ප්‍රධානීන් ලෙස ප්‍රවෘත්ත්‍යාධිකාරී, ප්‍රවෘත්ති අධ්‍යක්ෂ සහ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් යන තනතුරු නාම දරමින් පහත නිලධාරීන් කටයුතු කර ඇත.

1948	-	පී.නඩේශන් මහතා
1949	-	ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා
1950	-	වී.ටී.ආර්.විවියන් හොරයින් මහතා
1952	-	ඩී.අයි.එච්.ඒ.ජේ.හුළුගල්ල මහතා
1955	-	නඩේශන් පරරාජශිංගම් මහතා
1956	-	ජී.ලයනල් පෙරේරා මහතා
1957	-	ජී.ඩබ්.ඒ.එම්.පෙරේරා මහතා
1958	-	ජේම්ස් පෙරේරා මහතා
1959	-	ටී.එම්.ජයරත්නම් මහතා
1960	-	තිලක් එරංග ගුණරත්න මහතා
1961	-	ඩබ්.එල්.ප්‍රනාන්දු මහතා
1962	-	එස්.බී.සේනානායක මහතා
1966	-	ඩී.අළුවිහාරේ මහතා
1967	-	පී.එන්.මැද්දේගොඩ මහතා
1968	-	ආචාර්ය එස්.එල්.බී.අමුණුගම
1972	-	පී.එච්.ප්‍රේමවර්ධන මහතා
1974	-	ඩබ්.ආර්.පී.තිලකරත්න මහතා
1977	-	එස්.අනුර ගුණසේකර මහතා
1983	-	මානෙල් අබේරත්න මහත්මිය
1990	-	කේ.එස්.විමලසේන මහතා

1991 - කේ.ආර්.එල්.විජේවර්ධන මහතා

1992 - මහාචාර්ය සුනන්ද මද්දුමබණ්ඩාර

1994 - ආරිය රූබසිංහ මහතා

2003 - කේ.ඒ.බී.ජේ.පී.ජයසේකර මහතා

2004 - ඩබ්.එම්.පියසේන මහතා

2005 - කාන්ති විජේතුංග මහත්මිය

එස්.ඩී.පියදාස මහතා

2006 - වී.පී.කේ.අනුෂ පැල්පිට මහතා

ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරුන් .....

2009.02.01 සිට 2010.05.06 දක්වා - වී.පී.කේ.අනුෂ පැල්පිට මහතා

2010.05.07 සිට 2015.01.08 දක්වා - මහාචාර්ය ආරියරත්න ඇතුගල

2015.01.13 සිට 2015.05.07 (වැ.බ.) - කේ.ඩබ්.ටී.එන්.අමරතුංග මහත්මිය

2015.05.08 සිට 2017.06.02 - ආචාර්ය දර්ශනී ගුණතිලක

2016.06.06 සිට 2017.09.29 දක්වා - ආචාර්ය රංග කලන්සූරිය

2017.10.13 සිට 2018.10.26 - නීතීඥ සුදර්ශන ගුණවර්ධන මහතා

2018.10.27 සිට මේ දක්වා - නාලක කලුවැව මහතා

දැක්ම

"නිදහස් හා වගකීමෙන් යුතු මාධ්‍ය සම්ප්‍රදායක් උදෙසා දායක වීම"

මෙහෙවර

"ශ්‍රී ලාංකේය සන්නිවේදන මාධ්‍ය අතර සුහදශීලී පරිසරයක් නිර්මාණය කිරීම හා මාධ්‍ය සංස්කෘතිය නඟා සිටුවීම සඳහා අවශ්‍ය මෙහෙයවීම සිදුකරමින් නිවැරදි තොරතුරු හා රජයේ දැක්ම දැන ගැනීමට ඇති අයිතිය තහවුරු කිරීම"

අරමුණු

- රාජ්‍ය ප්‍රතිපත්ති හා සංවර්ධන ක්‍රියාදාම ඇතුළුව ජාතික වැදගත්කමකින් යුතු කාලීන ක්‍රියාකාරකම් පිළිබඳ මහජනතාව දැනුවත් කිරීම
- උසස් මාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීම
- වෘත්තීය ජනමාධ්‍ය සංස්කෘතියක් ගොඩනැඟීමට අනුබලදීම හා නායකත්වය සැපයීම
- ඉහත අභිමාර්ථ සපුරා ගැනීම සඳහා මානව හා භෞතික සම්පත් සංවර්ධනය කිරීම
- ගෝලීය තාක්ෂණ ප්‍රවණතාවයන්වලට අනුගත වෙමින් (ඩිජිටල්කරණය) තොරතුරු තාක්ෂණය, ගෝලීය ප්‍රවණතාවයන්ට අනුකූලව කළමනාකරණය කිරීම

1.3. ප්‍රධාන කාර්යයන්

- ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම

- තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන ප්‍රචාරන වැඩ පිළිවෙල පිළිබඳ තොරතුරු ජනතාව වෙත ගෙන යාම


- මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

- යහපාලනය, සංහිඳියාව, තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම

- වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම

- මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම

1.4. සංවිධාන සටහන



**. නිලධාරියාගෙන් පසු තනතුර අහෝසි වීමට යටත්ව අනුමත වී ඇති තනතුරු නාම

1.5. දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

01. පාලන අංශය
02. ගිණුම් අංශය
03. ප්‍රචාරක අංශය
04. සංවර්ධන අංශය
05. නව මාධ්‍ය ඒකකය
06. දෙසතිය හා දෙසතිය බෙදා හැරීම් අංශය
07. ඡායාරූප අංශය
08. රජයේ චිත්‍රපට අංශය
09. දිස්ත්‍රික් මාධ්‍ය ඒකක අංශය
10. මාධ්‍ය හැඳුනුම්පත් අංශය
11. ඩිජිටල් යටිතල පහසුකම් අංශය
12. රජයේ ප්‍රකාශන කාර්යාංශය
13. පර්යේෂණ හා මාධ්‍ය විමර්ශන අංශය

1.6. අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ පළාත් සභාව යටතේ පවතින ආයතන/ අරමුදල්

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ පවතින ආයතන නොමැත.

1.7. විදේශ ආධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ විදේශ ආධාර ලබන ව්‍යාපෘති නොමැත.

02 පරිච්ඡේදය

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

ප්‍රගතිය හා ඉදිරි දැක්ම

සෑම විටම නව තාක්ෂණය මුසුකරගනිමින් සන්නිවේදනයේ නව තාක්ෂණික ප්‍රමුඛතා සමඟ සමගාමීව රජයේ නිල පුවත් සන්නිවේදනයේ ප්‍රමුඛයා බවට පත් වීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඉදිරි දැක්මයි.

නවීන තාක්ෂණයත් සමඟ වර්තමානයේ දෛනික කටයුතු සම්ප්‍රදායික කාර්යන්ගෙන් එහා ගිය ඩිජිටල් තාක්ෂණයත් සමඟ සියලු කාර්ය ඩිජිටල්කරණයට (Digitalization) ලක්වෙමින් කාර්යයන් වඩාත් පහසුවෙන් සිදු කෙරෙන ඩිජිටල් අවකාශය තුළ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ඉදිරියට පියවර තබමින් සිටී.

සියලු මාධ්‍ය ආයතන සමඟජාලගත වෙමින් ප්‍රවෘත්ති මූලාශ්‍රය ලෙස රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව කටයුතු කරනු ලබන අතර රජයේ සියලු කාලීන හා සංවර්ධන තොරතුරු රජයේ සහ පෞද්ගලික මුද්‍රිත විද්‍යුත් මාධ්‍ය වෙත ලබාදීමේ රජයේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කරනු ලබයි.

එසේම වර්තමානයේ ඩිජිටල් අවකාශය තුළ ජනතාවට විශ්වසනීය තොරතුරු සපයන්නා බවට කෙරෙන දැවැන්ත අභියෝගය භාර ගනිමින් ජනතාව වෙත තොරතුරු සන්නිවේදනය කිරීමේ ඩිජිටල් වේදිකාව මෙම වසරේ ඉහළ මට්ටමට ගෙනඒමට හැකිවීම රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂී වූ ජයග්‍රහණයකි.

දෙපාර්තමේන්තුව යටතේ පවතින වෙබ් අඩවි, සමාජ මාධ්‍ය ජාලය තුළ වසරක් වැනි කෙටි කාලයක් තුළ සුවිශේෂී ක්‍රියාකාරකම් ගණනාවක් සිදු කරමින් ජනතා කේන්ද්‍රීය තොරතුරු ජාලය නිර්මාණය කිරීමට ද හැකිවී ඇත.

ඩිජිටල්කරණයේ සුවිශේෂී අවස්ථා

සමාජ මාධ්‍ය ජාලය තුළ නොයෙකුත් අවස්ථාවල සාවද්‍ය තොරතුරු සැරිසරන අතර සෑම විටම ජනතාවට ලැබෙන තොරතුරුවල නිරවද්‍යභාවය, විශ්වසනීයත්වය ඇති කිරීම අනිවාර්ය වේ. ඒ වෙනුවෙන් මේ වන විට වැඩි පිරිසක් අතර ප්‍රචලිත සමාජ මාධ්‍ය භාවිත කරමින් විශ්වසනීය තොරතුරු ජනතාව වෙත ඩිජිටල් අවකාශය තුළ ලබාදීමට කටයුතු කිරීම. ඒ අනුව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව www.dgi.gov.lk, “department of Government Information”YouTube නාලිකාව සහ Face Book පිටුව සහ www.newslk වෙබ් අඩවිය,YouTube නාලිකාව සහ Face Book පිටුව හා Twitter යන සියලු ජාලයන් ඔස්සේ විශ්වසනීය තොරතුරු ජනතාව වෙත සෘජුව සන්නිවේදනය කරනු ලබයි.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ ඩිජිටල්කරණයේ සුවිශේෂී ජයග්‍රහණ

	වැඩසටහන	ක්‍රියාත්මක කිරීම
මාධ්‍ය වෙත පහසුකම් සැලසීම		
01	මාධ්‍ය වෙත තොරතුරු ලබාදීම සඳහා cloud අවකාශය භාවිතය	රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මාධ්‍ය වෙත තොරතුරු ලබාදීමේ මූලාශ්‍රය ලෙස කටයුතු කරනු ලබන අතර එය සාම්ප්‍රදායික ක්‍රමයෙන් ඉදිරියට පිවිස වීඩියෝපට, හඬ පට, ඡායාරූප, ප්‍රවෘත්ති නිවේදනසියල්ල සියලු මාධ්‍ය වෙත එකම මොහොතක් තුළ කඩිනමින් ලබාදීම
02	දෙපාර්තමේන්තුව මඟින් සිදු කරනු ලබන සියලුම මාධ්‍ය ආවරණ මාධ්‍ය වෙත කඩිනමින් නිකුත් කිරීම	රජය මඟින් ක්‍රියාත්මක කරනු ලබන වැඩසටහන් සම්බන්ධයෙන් සිදුකරනු ලබන සියලු මාධ්‍ය ආවරණවල තොරතුරු ඇතුළත් නිවේදනය සහිතව වීඩියෝපට, හඬ පට, ඡායාරූප යනාදී සියල්ල මාධ්‍ය වෙත නිකුත් කිරීම. මෙම ක්‍රමවේදය ආරම්භ කිරීමට පෙර ඒ සඳහා විධිමත් ක්‍රමවේදයක් නොතිබුණු අතර ඒ සියලු කටයුතු මනා සම්බන්ධීකරණයෙන් සියලුම මාධ්‍ය ආයතන අතර මනා සම්බන්ධතාවයකින් ක්‍රියාත්මක කිරීමට හැකි වී තිබීම.
03	ඊමේල් System සකස් කිරීම	මෙරට සියලුම මාධ්‍ය එනම්, මුද්‍රිත, විද්‍යුත්, වෙබ් මාධ්‍ය, නව මාධ්‍ය, විදෙස් මාධ්‍ය ඇතුළු සියලුම මාධ්‍යයන් වෙනුවෙන් 200 ආසන්න ඊමේල් පද්ධතියක් තුළින් තොරතුරු හුවමාරු කිරීම
04	සියලුම මාධ්‍යවේදීන් සඳහා මාධ්‍ය හැඳුනුම්පත නිකුත් කිරීම	ලිපිගොනු ඔස්සේ පවත්වාගෙන ගිය මාධ්‍ය හැඳුනුම්පත් නිකුත් කිරීම වෙනුවට දත්ත පද්ධතියක් (Data Base) සකස් කිරීම හා මාධ්‍යවේදීන් සඳහා සිය වෘත්තීය අභිමානයක් ලබාදීමට කටයුතු කිරීම.
ජනතාව වෙත සෘජුව තොරතුරු ලබාදීම		
	“Department of Government Information” YouTube	Department of Government Information You Tube නාලිකාව 2019 වසරේ ජනවාරී වන විට අක්‍රිය තත්ත්වයේ පේක්ෂකයින් 12 දෙනෙකු පමණක් සිටි අතර එම වසර අවසන් වන විට 1000කට වැඩි

	විකාශය පවත්වාගෙන යාම	පිරිසක් ඒ සඳහා එක් කර ගැනීමට හැකි විය.එහිදීවීඩියෝ පට විවිධ තේමාවන් ඔස්සේ සකස් කර ඉදිරිපත් කිරීමට කටයුතු කර තිබේ. එනම්,INFO News, INFO Highlights, අතුළාන්තය (Inside), INFO News Parliament Highlights, Provincial Highlights, Taller, Documentary, Short video Reel, 2019මැතිවරණයේ නිල ඡන්ද ප්‍රතිඵල සජීවී මැතිවරණ විකාශයනොකඩවා පැය 24ක් එනම්, අවසන් නිල ඡන්ද ප්‍රතිඵලය දක්වා පවත්වාගෙන යාම දෙපාර්තමේන්තුව ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් විය. එම අවස්ථාවේ දෙස් - විදෙස් විශාල ජනතාවක් මෙම YouTube නාලිකාව සමඟ එක්ව සිටි අතර ඉහළ ජනතා ප්‍රසාදයට ද ලක් විය.
	“Department of Government Information”FaceBook පිටුව පවත්වාගෙන යාම	2019 ජනවාරි වන විට මෙම face book පිටුව සමඟ 90,000ක පමණ පිරිසක්එක්ව(like) සිටි අතර එය 20,000ක සංඛ්‍යාවකින් ඉහළ නැංවීමට හැකි විය. අන්තර්ගතය විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ සකස් කිරීමට අවධානය යොමු වූ පසුface book like, people reached, engage සංඛ්‍යාව දිනෙන් දින ඉහළ මට්ටමකට ගෙන ඒමට හැකි විය. මෙහිදී කාලීන හා සංවර්ධන ප්‍රවෘත්ති ඇතුළත් වීඩියෝ පට (You Tube නාලිකාවේ සියලුම වීඩියෝ) නිර්මාණාත්මක post සහ ඡායාරූප කෙටි විස්තරයක් සහිතව මෙහි යාවත්කාලීන කිරීම සිදු වේ. 2019 ජනාධිපතිවරණ නිල ඡන්ද ප්‍රතිඵල විකාශය, නිල ඡන්ද ප්‍රතිඵල සහිත face book post පල කිරීම මෙම පිටුව හරහා ද සිදු වූ අතර ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් මේ වටා එක්ව සිටියහ. මේ වන විට සතියකට ලක්ෂයට වැඩි reachedසංඛ්‍යාවක් පවත්වාගෙන යාමට හැකි වී තිබේ.
	www.news.lk web අඩවිය	කාලීන හා සංවර්ධන සියලුම ප්‍රවෘත්ති මෙම වෙබ් අඩවිය ඔස්සේ යාවත්කාලීන කිරීම භාෂා ත්‍රිත්වයෙන්ම සිදු වන අතර පැය 24 පුරා යාවත්කාලීන වන රජයේ නිල පුවත් වෙබ් අඩවිය වේ. මෙම වෙබ් අඩවිය යටතේ Face book පිටුව, You Tube නාලිකාව, twitter පිටු ක්‍රියාත්මක වේ.

		2019 ජනාධිපතිවරණ නිල ඡන්ද ප්‍රතිඵල වෙබ් අඩවියේ යාවත්කාලීන කිරීම, Face book පිටුව, You Tube නාලිකාව ඔස්සේ විකාශය පවත්වා ගෙන යාම සිදු කෙරිණි. එසේම කැබිනට් මාධ්‍ය සාකච්ඡාව ඇතුළු විශේෂ මාධ්‍ය සාකච්ඡා සජීවී විකාශය පවත්වාගෙන යාම මෙම වසර තුළ ආරම්භ කළ අතර ඒ සඳහා ඉහළ ප්‍රතිචාර ලැබෙමින් පවතී.
	දෙසතිය	ජනතාව වෙත කාලීන හා සංවර්ධන මෙන්ම විදෙස් තොරතුරු කැටි කරගත් වසර 42ක ඉතිහාසයකට හිමිකම් කියන සඟරාව නියමිත පිරිදි සති දෙකකට වරක් නියමිත දිනට නිකුත් කිරීමට කටයුතු කිරීමට හැකි විය. මෙම සඟරාව බෙදාහැරීමේ කටයුතු නව ක්‍රමවේදයක් ඔස්සේ සිදු කිරීමට අවශ්‍ය ගිවිසුම් ශ්‍රී ලංකා තැපැල් දෙපාර්තමේන්තුව සමග ඇති කර ගැනිමට හැකි විය. මෙහිදී පළමු අදියර යටතේ තැපැල් කාර්යාල 100ක් හරහා මෙම සඟරාව ජනතාවට ලබාගැනීමට පහසුකම් සලසා ඇත.
මාධ්‍ය සංරක්ෂිත පද්ධතියක් ක්‍රියාත්මක කිරීම		
	ඩිජිටල් සංරක්ෂිත පද්ධතියක් ස්ථාපිත කිරීම	මෙම දෙපාර්තමේන්තුව සතුව පවතින ඓතිහාසික වැදගත් චිත්‍රපට, වීඩියෝ පට, ඡායාරූප යනාදිය ඩිජිටල් තාක්ෂණයට හැරවීමේ (Convert To Digital) ව්‍යාපෘතියක් ද ආරම්භ කර තිබේ. මේ වන විට පැරණි චිත්‍රපට 100ක් පමණ ඩිජිටල් තාක්ෂණයට convert කර, සංරක්ෂණය කිරීමට කටයුතු යොදා ඇත ඊට අමතරව ඩිජිටල් සංරක්ෂිත පද්ධතිය ස්ථාපිත කිරීම ද මෙම වසරේ සිදු වූ ප්‍රධාන කාර්යයක් වූ අතර එහි විශේෂිත වූ වීඩියෝ පට, ඡායාරූප සංරක්ෂණය කිරීම එදිනෙදා සිදු කෙරෙන කාර්යයක් බවට මෙම වසර තුළ පත් කිරීමට හැකිවීම.

මාධ්‍ය වෙත තොරතුරු ලබාදීමේ පහසුකම් විධිමත් ලෙස පුළුල් කිරීම

යහපත් සාමාජ පැවැත්මක් උදෙසා මාධ්‍ය ක්ෂේත්‍රයේ වගකීම් හා ප්‍රතිපත්ති නිරතුරුවම වැදගත් වන බැවින් විශ්වසනීයත්වයෙන් සත්‍ය තොරතුරු වාර්තාකරණය වෙනුවෙන් මාධ්‍ය ආයතන තොරතුරුවලින් සන්නන්ධ කිරීම කාලීන අවශ්‍යතාවක් වේ. ඒ අනුව රජයේ සංවර්ධන හා

කාලීන තොරතුරු විධිමත් ක්‍රමවේදයක් ඔස්සේ මාධ්‍ය වෙත සන්නිවේදනය කිරීමේ වැඩපිළිවෙළක් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කිරීම සඳහා කටයුතු යොදා ඇත. ඒ අනුව Cloud තාක්ෂණය භාවිත කරමින් ඒ ඔස්සේ මාධ්‍ය ආයතන වෙත වීඩියෝ පට, ඡායාරූප, මාධ්‍ය නිවේදන යන සියල්ල කඩිනමින් ලබාදීමේ විධිමත් ක්‍රමවේදය ආරම්භ කර තිබේ.

විශේෂ ජයග්‍රහණ,

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් ඉටු කරන ලද කාර්යභාරය අගයනු වස් 2019 වර්ෂයේ පහත සඳහන් සම්මාන හිමි කර ගනිමින් විශේෂ ජයග්‍රහණ අත්පත් කර ගැනීමට සමත් විය.

- සෞඛ්‍ය ප්‍රවර්ධන මාධ්‍ය සම්මාන උළෙල - 2019
- වෙබ් මාධ්‍ය සමස්ත විශිෂ්ඨතා සම්මානය - “Department of Government Information” You Tube නාලිකාව
- සහරා මාධ්‍ය වෙනුවෙන් විශිෂ්ඨතා සම්මානය - දෙසතිය සහරාව
- වෙබ් මාධ්‍ය වෙනුවෙන් විශිෂ්ඨතා සම්මානය - www.news.lk

අභියෝග හා ඉදිරි ඉලක්ක

රාජ්‍යප්‍රතිපත්ති,රජයේසංවර්ධනක්‍රියාදාමයඇතුළුවජාතිකවැදගත්කමකින්යුතුකාලීනක්‍රියා කාරකම්සහජනතාවවෙනුවෙන්රජයමගින්ඉටුකරනුලබනකාර්යභාරයපිළිබඳවමහජනතාවදැනුව ත්කිරීමමෙමදෙපාර්තමේන්තුවේප්‍රධානවගකීමහාකාර්යභාරයවේ.එසේම ගෝලීයතාක්ෂණප්‍රවණතාවන්වලටඅනුගතවෙමින්තොරතුරුතාක්ෂණක්‍රියාවලියකළමනාකරණය කර,නිදහස්භාවගකිවයුතුඋසස්මාධ්‍යසංස්කෘතියක්ගොඩනැගීමසඳහා අනුබල දීම හා නායකත්වය සැපයීම ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

සුරක්ෂිත රටක් සහ සෞභාග්‍යමත් දේශයක් ගොඩනැඟීමට පාදක වන ලෙස ජනතාව නිවැරදි තොරතුරුවලින් හා දැනුමින් සන්නද්ධ කරලීම උදෙසා ජනමාධ්‍ය වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා වූ පැහැදිලි ජනමාධ්‍ය ප්‍රතිපත්තියක් සමාජය තුළ ස්ථාපිත කිරීමට පෙරමුණ ගෙන ක්‍රියා කිරීමට අපේක්ෂිතය.

එහිදී 2020 වර්ෂයේ පහත සඳහන් මූලික වැඩසටහන් කෙරෙහි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව ප්‍රමුඛතාවය ලබා දී ඇත.

01. "ජනමාධ්‍ය ස්ථාගාර(Press Clubs) ස්ථාපිත කිරීම"

01. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් සැලසුම් කර, දෙපාර්තමේන්තු භූමියේ ඉදි කිරීමට බලාපොරොත්තු වන මාධ්‍යවේදීන්ට පහසුකම් සැපයීමේ මධ්‍යස්ථානය (Media Personal Facilitation Center)තව දුරටත් වැඩි දියුණු කරමින් බස්නාහිර පළාත සඳහා වන ප්‍රධාන ජනමාධ්‍ය ස්ථාගාරය (Press Club) පිහිටුවීමට සැලසුම් කර ඇත. මෙහි ජනමාධ්‍යවේදීන් වරකට 50කට පමණ අවශ්‍ය පහසුකම් සැපයීමට සැලසුම් කර ඇත.

- ඇස්තමේන්තුගත පිරිවැය-රුපියල් මිලියන 40
- කාල පරාසය-මාස 07කින් පමණ ඉදිකිරීමට අපේක්ෂිතයි.
- වර්තමාන තත්ත්වය-ගොඩනැගිල්ල සැලසුම් කිරීම හා ලංසු කැඳවීම අවසන් කර ඇත.
- කොන්ත්‍රාත් ප්‍රදානය -2020 පෙබරවාරී මාසයේදී සිදු කිරීමට නියමිතය.
- මූල්‍ය ප්‍රතිපාදන-2020 අතුරු සම්මත ගිණුමෙන් රුපියල් මිලියන 4ක් ලැබී ඇති අතර කොන්ත්‍රාත් ප්‍රදානය සඳහා වන ඉතිරි මිලියන 06ක මුදල මීලඟ අතුරු සම්මත ගිණුම මඟින් ලබා දෙනු ඇත.

02. පළාත්ජනමාධ්‍යස්ථාගාර(Press Clubs) ස්ථාපිත කිරීම

පළාත් මට්ටමින් මෙම පහසුකම ස්ථාපිත කිරීමට සුදුසු ස්ථාන හඳුනාගන්නා ලෙස මේ වන විටත් දිසාපතිවරුන් හා රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ දිස්ත්‍රික් මාධ්‍ය ඒකකවල නිලධාරීන් වෙත උපදෙස් ලබා දී ඇත. ඒ අනුව මේ වන විට මාතර ස්ථානයක් හඳුනාගෙන ඇත. මේ සඳහා සියලු පළාත්වල,සුදුසු ස්ථානයන් තෝරා ගැනීමට පොදු සැලැස්මක් පිළියෙල කරන අතර ඒ සඳහා වන වියදම්, ඇස්තමේන්තු කිරීමෙන් පසු මීලඟ අයවැයෙන් අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කරනු ඇත.

02. "ඉහළ වෘත්තිය නිපුණතා සහිත මාධ්‍ය වෘත්තිකයන් බිහි කිරීම"

01. නව රජයේ රාජ්‍ය ප්‍රතිපත්ති අනුව ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය දැනුම සංවර්ධනය කිරීම සඳහා රාජ්‍ය අනුග්‍රහය යටතේ මාධ්‍ය පුහුණු ආයතනයක් ස්ථාපිත කිරීම ගරු තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍ය, ආචාර්ය බන්ධුල ගුණවර්ධන මැතිතුමාගේ හා ගරු තොරතුරු සහ ජනමාධ්‍ය රාජ්‍ය අමාත්‍ය, ලක්ෂ්මන් යාපා අබේවර්ධන අමාත්‍යවරුන්ගේ උපදෙස් පරිදි තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ ලේකම් හා රාජ්‍ය අමාත්‍යාංශයේ ලේකම් තුමන්ලාගේ මඟ පෙන්වීම යටතේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව වෘත්තිය මධ්‍ය පුහුණු ආයතනය ස්ථාපිත කිරීමේ මූලික

කාර්යභාරය මේ වන විට ආරම්භ කර ඇත.

ඒ අනුව ජනමාධ්‍ය විෂය පිළිබඳව එක් වසරක පුහුණු කාලයකට යටත්ව ජනමාධ්‍ය ඩිප්ලෝමා පාඨමාලාවක්, සය මාසික ජනමාධ්‍ය සහතික පත්‍ර පාඨමාලාවක් හා ත්‍රයිමාසික ජනමාධ්‍ය වෘත්තීය හා ඡායාරූප හා වීඩියෝ පාඨමාලාවක් ආරම්භ කිරීම සඳහා විෂය නිර්දේශයන් මේ වන විට සකස් කර තිබේ. එම කාර්යයරජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්ගේ උපදෙස් පරිදි පහත සඳහන් උපදේශක මණ්ඩලය විසින් ඉටු කරනු ලැබේ.

1. මහාචාර්ය කමල් වලේබොඩ මහතා
2. ආචාර්ය ධර්මකීර්ති ශ්‍රී රන්ජන් මහතා
3. සහකාර අධ්‍යක්ෂ, හර්ෂ බී.අබේකෝන් මහතා

02. යහපත් ජනමාධ්‍ය සංස්කෘතියක් බිහිකර, ගුණාත්මක ජනමාධ්‍ය වෘත්තීමයභාවය දියුණු කිරීම සඳහා විශ්ව විද්‍යාල ප්‍රජාව, ජනමාධ්‍ය වෘත්තිකයන් හා විද්වත් ජනතාව ඉලක්ක කර ඉහළ ශාස්ත්‍රීය මට්ටමින් ජනමාධ්‍ය සඟරාවක් (මාධ්‍ය සංහතික සය මාසික සඟරාවක්) මුද්‍රණය කිරීමට කටයුතු කරනු ලැබේ.

03. "විසි එක් වන සියවසට ගැළපෙන සමාජයක් නිර්මාණය කරනු පිණිස භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස අප ඉහළින්ම පිළිගන්නා අතර ඒවා රැක ගැනීම පිණිස උපරිමයෙන් ක්‍රියා කෙරේ. ඒ සඳහා ජනමාධ්‍ය ආයතන හා එහි සේවයේ නියුතුවෘත්තියවේදීන්ගේ කාර්යභාරය සඳහා අවශ්‍ය නිවහල් හා නිරවුල් පරිසරය නිර්මාණය කිරීම රජයේ වගකීම ලෙස සලකනු ඇත"

01. යහපත්ජනමාධ්‍යසංස්කෘතියක්බිහිකිරීමසඳහාරාජ්‍ය මාධ්‍ය ආයතන විසින් ඉටු කරනු ලබන ජාතික වගකීම හා රජයේ සංවර්ධන වැඩසටහන් ජනතාව අතරට ගෙන යාමේදී රාජ්‍ය මාධ්‍ය ආයතන විසින් ඉටුකළ යුතු කාර්යභාරය ද සැලකිල්ලට ගෙන රාජ්‍ය මාධ්‍ය ආයතනවල ජාතික කාර්යභාරය ඇගයීම සඳහා තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශයේ මූලිකත්වයෙන් රාජ්‍ය මාධ්‍ය ඒකාබද්ධ ජාතික ජනමාධ්‍ය පර්යේෂණ ඒකකයක් ස්ථාපනය කිරීමට තීරණය කර ඇති අතර, ඒ සඳහා අවශ්‍ය කැබිනට් මණ්ඩල අනුමැතිය ලබා ගැනීම සඳහා මූලික කටයුතු සකස් කරනු ලැබේ.

02. පාසල්විෂයමාලාවටජනමාධ්‍යවිෂයහඳුන්වාදීදශකදෙකකටආසන්නකාලයක්ගතවීඇත. එහෙත් දැනටපාසල්පද්ධතියතුල අවිධිමත් ලෙස ක්‍රියාත්මක වන පාසල් ජනමාධ්‍ය සමාජ

වැඩසටහන් විධිමත් කරමින් පාසල්වල ජනමාධ්‍ය විෂය උගන්වන ගුරුවරුන්ගේ වෘත්තීය දැනුම දියුණු කරමින් පාසල් ජනමාධ්‍ය ආචාර්යවරුන් රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව යටතේ ලියාපදිංචි කරනු ලැබේ. (මෙම වැඩසටහන දැනට ක්‍රියාත්මක කර ඇත.)

පාසල් ජනමාධ්‍ය සමාජ විධිමත් කිරීමේ වැඩසටහන යටතේ පාසල් ජනමාධ්‍ය සමාජ ලියාපදිංචි කිරීම සහ ක්‍රියාකාරී ලෙස ජනමාධ්‍යවේදයේ නිරත පාසල් දරුවන්ගේ කුසලතා හා දැනුම වර්ධනය කිරීම සඳහා විවිධ වැඩසටහන් ආරම්භ කිරීම. (මෙම වැඩසටහන දැනට ක්‍රියාත්මක කර ඇත.)

පාසල් ජනමාධ්‍ය සමාජ විධිමත් ලෙස ක්‍රියත්මක වන ජාතික හා සෙසු පාසැල් තෝරා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ හා ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙන් බිත්ති පුවත්පත් 500ක් පළමු අදියර යටතේ ලබා දීමට කටයුතු කරනු ලැබේ.

වෘත්තීමය ගුණාත්මක ජනමාධ්‍ය සේවාවක් බිහි කිරීම සඳහා විශ්වවිද්‍යාල ජනමාධ්‍ය අංශ ඒකාබද්ධව විද්වත් කථිකාවන් දේශීය හා ජාත්‍යන්තර සම්පත් දායකයින් මඟින් symposiumසංවිධානය කිරීම.


04. ඩිජිටල්කරණය-කෙටිකාලීන ප්‍රවේශය

“සමාජ මාධ්‍ය ඇතුළු නව මාධ්‍ය භාවිතය සහ හැසිරවීම පිළිබඳ දැනුම, අවබෝධය හා සන්නිවේදන උපක්‍රම සමාජගත කරනු පිණිස අවශ්‍ය පියවර ගනු ලැබේ”

රාජ්‍ය නිල සන්නිවේදන ප්‍රධානියා ලෙස රජයේ සන්නිවේදන කාර්යභාරය තවදුරටත් පුළුල් කරමින් නූතන සමාජ මාධ්‍ය භාවිතය උපරිම ලෙස දායක කරමින් රජයේ සංවර්ධන පුවත් මෙන්ම රජයේ වැදගත් තොරතුරු සමාජ මාධ්‍ය ජාලය හරහා ජනගත කිරීමේ මෙහෙයුමක් ආරම්භ කිරීම.

- කාලීන හා සංවර්ධන තොරතුරු ඇතුළත් ෆේස්බුක් පිටුව නව මුහුණුවරකින් ඉදිරිපත් කිරීම.
- කැබිනට් මාධ්‍ය හමුව ඇතුළු විශේෂ මාධ්‍ය සාකච්ඡා, ජාතික උත්සව සජීවී විකාශය පවත්වා ගෙන යාම.
- Face bookහා you tube ග්‍රාහක සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා පියවර ගැනීම.
- සෞභාග්‍යයේ ඉදිරි දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශය සම්බන්ධයෙන් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කල කතාව පිළිබඳ කෙටි වීඩියෝ පට සමාජ මාධ්‍ය ඔස්සේ ප්‍රචාරය කිරීම.

- සෑම සතියකම පැවැත්වෙන කැබිනට් මාධ්‍ය හමුවේ විශේෂ කරුණු සම්බන්ධයෙන් කෙටි වීඩියෝ පට සහ නිර්මාණාත්මක පෝස්ටු සහිතව Face bookහා You tube ඔස්සේ ප්‍රචාරණය කිරීම.
- සියලු අමාත්‍යාංශ සම්බන්ධ කරගනිමින් දිනපතා නිර්මාණය කරනු ලබන ප්‍රවෘත්තිවීඩියෝපට සංඛ්‍යාව ඉහළ නැංවීම.
- අමාත්‍යාංශය මඟින් සිදු කරනු ලබන වැඩසටහන් පිළිබඳව තොරතුරු ලබා ගැනීම සඳහා සමාජ මාධ්‍ය හරහා Face book Closed Group(DGI Media Coordination)සකස් කර, ඒ ඔස්සේ තොරතුරු ලබා ගැනීම හා එම තොරතුරු අනෙකුත් මාධ්‍ය වෙත ලබා දීමේ වැඩපිළිවෙළ.
- මාධ්‍ය වෙත තොරතුරු ලබා දීම විධිමත් කිරීම සඳහාcloud ක්‍රමවේදයක් සකස් කර තිබීම. ඒ ඔස්සේ දෙපාර්තමේන්තුව මඟින් ආවරණය කරනු ලබන සියලුම වැඩසටහන් පිළිබඳ තොරතුරු කඩිනමින් මාධ්‍ය වෙත වීඩියෝ,හඬපට,ඡායාරූප,ප්‍රවෘත්ති නිවේදන ආදිය මඟින් නිකුත් කිරීමට හැකිවීම.



නාලක කලුවැව

රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල් / ගණන් දීමේ නිලධාරී

03 පරිච්ඡේදය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්ය සාධනය

3.1 මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

ඒසීඒ - එෆ්

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ කාල සීමාව සඳහා වන මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

රු.

අයවැය 2019		සටහන	2019	තත්‍ය 2018	
-	**ආදායම් ලැබීම්**				
-	ආදායම් බදු	1	-	-	ඒසීඒ-1
-	දේශීය භාණ්ඩ හා සේවා මත බදු	2	-	-	
-	ජාත්‍යන්තර වෙළඳාම මත බදු	3	-	-	
-	බදු නොවන ආදායම් හා වෙනත්	4	-	-	
-	**මුළු ආදායම් ලැබීම් (අ)**		-	-	
-	**ආදායම් නොවන ලැබීම්**				
-	භාණ්ඩාගාර අග්‍රිම		310,930,000	313,920,000	ඒසීඒ-3
-	තැන්පතු		1,302,547	12,885,524	ඒසීඒ-4
-	අත්තිකාරම් ගිණුම්		12,517,778	10,198,266	ඒසීඒ-5/5(ඒ)/5(බී)
-	වෙනත් ලැබීම්		21,131,019	19,355,618	
-	**මුළු ආදායම් නොවන ලැබීම් (ආ)**		**345,881,344**	**356,359,408**	
-	**මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ) + (ආ)**		**345,881,344**	**356,359,408**	
	අඩු කළා : වියදම්				
-	**පුනරාවර්තන වියදම්**				
135,080,000	වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ	5	133,366,714	123,629,519	ඒසීඒ-2(ii)
119,947,000	අනෙකුත් භාණ්ඩ හා සේවා	6	118,544,529	389,689,937	
1,724,000	සහනාධාර, ප්‍රදාන සහ මාරු කිරීම්	7	1,723,193	1,935,467	
-	පොළී ගෙවීම්	8	-	-	

-	වෙනත් පුනරාවර්තන වියදම්	9	-	66,232	
256,751,000	**මුළු පුනරාවර්තන වියදම් (ඇ)**		**253,634,436**	**515,321,155**	
	මූලධන වියදම්				
19,416,000	මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම	10	15,774,039	10,653,092	
58,133,000	මූලධන වත්කම් අත්පත් කර ගැනීම්	11	45,571,377	26,633,580	
-	ප්‍රාග්ධන මාරු කිරීම්	12	-	-	ඒසිඒ-2(ii)
-	මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම	13	-	-	
4,000,000	හැකියා වර්ධනය	14	1,483,407	7,998,910	
-	වෙනත් මූලධන වියදම්	15	-	-	
81,549,000	**මුළු මූලධන වියදම් (ඉ)**		**62,828,823**	**45,285,582**	
-	ප්‍රධාන ලෙජර් වියදම් (ඊ)		**13,627,757**	**27,694,260**	
-	තැන්පතු ගෙවීම්		572,382	12,677,878	ඒසිඒ-4
-	අත්තිකාරම් ගෙවීම්		13,055,375	15,016,382	ඒසිඒ-5/5(ඒ)/5(බී)
-	මුළු වියදම් උ = (ඇ+ඉ+ඊ)		330,091,016	588,300,997	
-	2019 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)		**15,790,328**	**231,941,589**	

3.2 මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසිඒ-පී

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

		තත්‍ය	
	සටහන	**2019 (රු.)**	**2018 (රු.)**
මූල්‍ය නොවන වත්කම්			
දේපළ, පිරියත හා උපකරණ	ඒසිඒ-6	1,762,938,741	1,588,921,581
මූල්‍ය වත්කම්			
අත්තිකාරම් ගිණුම්	ඒසිඒ-5/5(ඒ)	36,964,465	36,426,868
මුදල් හා මුදල් සමාන දෑ	ඒසිඒ-3	168,073	-

මුළු වත්කම්		**1,800,071,279**	**1,625,348,449**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ශුද්ධ වත්කම්		28,033,141	28,225,710
දේපළ පිරියත හා උපකරණ සංචිතය		1,762,938,741	1,588,921,581
කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය	ඒසිඒ-5(බී)	-	-
ජංගම වගකීම්			
තැන්පතු ගිණුම	ඒසිඒ-4	8,931,324	8,201,158
අග්‍රිම ශේෂය	ඒසිඒ-3	168,073	-
මුළු වගකීම්		**1,800,071,279**	**1,625,348,449**

පිටු අංක 06 සිට 71 දක්වා ඒසිඒ6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක 72 සිට 90 දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදු කර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත්, ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

.....
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම : ඩබ්ලිව්.ඒ. චූලානන්ද පෙරේරා
තනතුර : ලේකම්, තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
දිනය : 2020.02. 25

.....
ගණන්දීමේ නිලධාරි
නම : නාලක කලුවැව
තනතුර : ප්‍රධාන්ති අධ්‍යක්ෂ ජනරාල්
දිනය : 2020.02. 20

.....
ප්‍රධාන ගණකාධිකාරි
නම : එච්.ඒ.ෂු. ජයලත්
දිනය : 2020.02.17

ඩබ්. ඒ. චූලානන්ද පෙරේරා
ලේකම්
තොරතුරු සහ ජනමාධ්‍ය අමාත්‍යාංශය
තැපැල් මූලස්ථාන ගොඩනැගිල්ල
310, ඩී.ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10.

නාලක කලුවැව
රජයේ ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

එච්. ඒ. ෂු. ජයලත්
ප්‍රධාන ගණකාධිකාරි
රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව
163, කිරුළපන මාවත,
කොළඹ 05

3.3 මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-සී

2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාල වර්ෂය සඳහා වන මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

	තත්‍ය	
	2019 (රු.)	**218 (රු.)**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
මුළු බදු ලැබීම්	-	-
ගාස්තු, අධිභාර, දඩ මුදල් සහ බලපත්‍ර	-	-
ලාභ	-	-
ආදායම් නොවන ලැබීම්	281,860	327,241,551
වෙනත් ශීර්ෂ වෙනුවෙන් එකතු කරන ලද ආදායම්	13,885,179	-
අග්‍රිම ලැබීම්	310,930,000	-
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ)	**325,097,039**	**327,241,551**
අඩු කළා - මුදල් වැය කිරීම්		
පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම්	230,937,450	267,254,968
සහනාධාර සහ මාරු කිරීම් වියදම්	1,723,193	1,935,467
වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම්	18,792,295	-
භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම	-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ)	**251,452,938**	**269,190,435**
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**73,644,101**	**58,051,116**
ඇ = (අ)– (ආ)		
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
පොළී	-	-
ලාභාංශ	-	-
භිමිකම් ඉවත් වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම	-	-
උපණය අය කර ගැනීම	-	-
අත්තිකාරම් අය කර ගැනීම	452,413	275,088
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඇ)	**452,413**	**275,088**

අඩු කළා - මුදල් වැය කිරීම් :		
භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත්	62,281,390	44,157,821
ආයෝජන අත්පත් කර ගැනීම්		
අත්තිකාරම් ගෙවීම්	11,331,894	13,970,719
ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය(ඉ)	**73,613,284**	**58,128,540**
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඊ) = (ඇ) + (ඉ)	**(73,160,871)**	**(57,853,452)**
මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය(උ) = (ඇ) + (ඊ)	**483,230**	**197,664**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්		
දේශීය ණය ගැනීම්	-	-
විදේශීය ණය ගැනීම්	-	-
ප්‍රදානයන් ලැබීම්	-	-
තැන්පතු ලැබීම්	257,225	12,460,214
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ)	**257,225**	**12,460,214**
අඩු කළා - මුදල් වැය කිරීම් :		
දේශීය ණය ආපසු ගෙවීම්	-	-
විදේශීය ණය ආපසු ගෙවීම්	-	-
තැන්පතු ගෙවීම්	572,382	12,657,878
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ)	**572,382**	**12,657,878**
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)= (ඌ)–(එ)	**(315,157)**	**(197,664)**
මුදල්වල ශුද්ධ වෙනස් වීම් (ඔ) = (උ) – (ඒ)	**168,073**	**-**
ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය	-	-
දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය	**168,073**	**-**

3.4 මූල්‍ය ප්‍රකාශ සටහන්

වාර්තා කිරීමේ පදනම

(1). වාර්තාකරණ කාල පරිච්ඡේදය

2019 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාල පරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාල පරිච්ඡේදය වේ.

(2). මිනුම්කරණ පදනම

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙළ කර ඇති අතර සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙළ කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදු කරයි.

(3). ආදායම් හඳුනා ගැනීම

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසළකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

(4). දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම්, එම වත්කම්, දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ.

දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථාවලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

(5). දේපළ, පිරියත හා උපකරණ සංචිතය

මෙම සංචිත ගිණුම් දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුම් වේ.

(6). මුදල් හා මුදල් සමාන දෑ

2019 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යාවහාර මුදල් නෝට්ටු සහ කාසිවලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5 ආදායම් එකතු කිරීමේ කාර්ය සාධනය

රු. ,000

ආදායම් කේතය	ආදායම් කේතයේ විස්තරය	ආදායම් ඇස්තමේන්තුව		එකතු කරන ලද ආදායම	
		මුදල් ඇස්තමේන්තුව	අවසන් ඇස්තමේන්තුව	ප්‍රමාණය (රු.)	අවසාන ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස
20.06.02.01	වාහන	-	2,090	2,089.4	99
20.06.02.02	අනෙකුත්	-	139	145.0	104
20.02.01.01	රජයේ ගොඩනැගිලි හා නිවාස කුලී	-	33.6	36.33	108
20.02.01.99	රජයේ වත්කම්වලින් ලැබෙන ආදායම - කුලී - අනෙකුත් කුලී	-	-	-	-
20.02.02.99	පොළිය - අනෙකුත්	1,000	1,000	1,485.3	148
20.03.01.00	විකුණුම් හා ගාස්තු - දෙපාර්තමේන්තුමය විකිණීම්	1,200	1,200	3,122.3	260
20.03.02.99	විකුණුම් හා ගාස්තු - පරිපාලනාත්මක ගාස්තු හා ගෙවීම් විවිධ	-	130	241	185
20.03.03.02	විකුණුම් හා ගාස්තු - දඩ මුදල් හා රාජසන්තක කිරීම් - අනෙකුත්	-	-	-	-
20.03.99.00	විකුණුම් හා ගාස්තු - අනෙකුත් ලැබීම්	900	900	683.4	75

20.05.99.00	වර්තන පැවරීම, ජාතික ලොතරැයි මණ්ඩලය හා අනෙකුත් පැවරුම්	-	-	-	-

3.7 වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්ය සාධනය

රු. ,000

ප්‍රතිපාදන වර්ගය	වෙන් කරන ලද ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කරනු ලැබූ ප්‍රතිපාදන, අවසන් කරන ලද අවසාන ප්‍රතිපාදන ප්‍රමාණයේ % ලෙස
	මුදල් ප්‍රතිපාදනය	අවසාන ප්‍රතිපාදනය		
පුනරාවර්තන	රු.226,650.00	රු.256,751.00	රු.253,634.00	98.7
ප්‍රාග්ධන	රු. 57,150.00	රු. 81,549.00	රු. 62,879.00	77.1

3.8 මු.රෙ.208 ප්‍රකාරව, වෙනත් අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

රු. ,000

අනු අංකය	ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව	ප්‍රතිපාදනයේ අරමුණ	ප්‍රතිපාදන		තත්‍ය වියදම	උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස
			මුල් ප්‍රතිපාදන	අවසාන ප්‍රතිපාදන		
01.	ජනමාධ්‍ය අමාත්‍යාංශය	වරිපනම් බද්ධ ගෙවීමට	-	560,844.00	560,844.00	100

		අමාත්‍යාංශ බදු අංශය දෙපාර්තමේන්තු ගොඩනැලිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 3%ක් ගෙවීමට		105,698.76	79,071.83	74.8
02.	රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව	ඔවුන්ගේ මුද්‍රණ අංශය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුල් බිලෙන් 25%ක් ගෙවීමට	400,000.00	800,000.00	1,028,109.05	85.7
03.	ප්‍රතිපත්ති සැලසුම්, ආර්ථික කටයුතු, ළමා, තරුණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	තාවකාලිකව ප්‍රතිපත්ති සැලසුම් හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයට පත්කර සිටින එල්.ඒ.රෝහණ මහතාගේ වැටුප ගෙවීමට	-	389,770.53	389,770.53	100
04.	මැතිවරණ කොමිසම	මැතිවරණ රාජකාරී වියදම් ගෙවීමට	-	1,199,110.00	1,184,010.89	98.7
05.	සෞඛ්‍ය, පෝෂණ සහ දේශීය වෛද්‍ය අමාත්‍යාංශය	SEITEM ප්‍රචාරන දැන්වීම් සඳහා ගෙවීමට	-	13,000,000.00	12,696,425.50	97.7
06.	ආරක්ෂක අමාත්‍යාංශය	ජාතික මාධ්‍ය මධ්‍යස්ථානයෙන් දෙපාර්තමේන්තුවට පත් කළ	-	2,000,000.00	1,069,655.00	53.5

		නිලධාරීන්ගේ වැටුප් ගෙවීම				
07.	මුදල් අමාත්‍යාංශය	ඔවුන්ගේ බදු අංශය දෙපාර්තමේන්තු ගොඩනැගිල්ලේ පවත්වාගෙන යාම සඳහා විදුලි බිලෙන් 3%ක් ගෙවීමට. මීට පෙර මුදල් හා ජනමාධ්‍ය එක් අමාත්‍යාංශයක් විය (2019.01.01 – 2019.07.31)	-	150,000.00	44,301.24	29.5
			400,000.00	18,205,423.29	17,052,188.04	91.7

3.9 මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්ය සාධනය

රු. ,000

වත්කම් කේතය	කේත විස්තරය	31.12.2019 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය	31.12.2019 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය	ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත	ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම
9151	ගොඩනැගිලි හා ව්‍යුහයන්	2019 වර්ෂයට අදාළ කා.සා.කටයුතු කෙරෙමින් පවතී	300,848,000.00	-	99%
9152	යන්ත්‍රෝපකරණ		197,655,240.28		
9153	ඉඩම්		1,227,750,000.00		
9154	අස්පෘශ්‍ය වත්කම්		-		
9155	ජීව විද්‍යාත්මක වත්කම්		-		
9160	කෙරීගෙන යන වැඩ		3,000,000.00		
9180	බදු දෙන ලද වත්කම්		-		

3.10 විගණකාධිපතිවරයාගේ වාර්තාව

**. පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමේදී, විගණකාධිපතිවරයා විසින් නිකුත් කරන ලද අවසාන විගණන වාර්තාව පරිලෝකනය කර, (SCAN) කොට මෙහි අන්තර්ගත කළ යුතුය.

ශීර්ෂය 210 - රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 ජුනි 25 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 28 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් වියහැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදි.

- භාවිතාකරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනයෙන් හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) වගන්තිය හා 38 වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බව,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 මූල්‍ය තත්ව ප්‍රකාශය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
සමාලෝචිත වර්ෂයේදී මූලධන වත්කම් අත්පත් කර ගැනිම සඳහා රු. 42,571,377 ක් වැයකර තිබූ නමුත් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය අනුව එය රු. 42,400,678 ක් වූයෙන් රු. 170,699 ක වෙනසක් නිරීක්ෂණය විය.	වැය කර ඇති සියලු වියදම් මූල්‍ය ප්‍රකාශන තුළ නියමිත පරිදි ඇතුළත් කළ යුතු වීම.	ලෙජරය අනුව රු.42,571,377 ක වියදමක් දරා තිබූ නමුත් දෙපාර්තමේන්තුව මඟින් මිලදී ගෙන ඇත්තේ රු.42,405,177 ක වත්කම් පමණි.

1.6.2 මුදල් ප්‍රවාහ ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආදායම් නොවන ලැබීම් රු. 281,860 ක් හා වෙනත් ශීර්ෂ වෙනුවෙන් රැස්කළ ආදායම රු.13,885,179 ක් වශයෙන් දක්වා තිබුණි. එසේ වුවද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව ආදායම් නොවන ලැබීම් ශීර්ෂයක් නොතිබූ අතර, වෙනත් ශීර්ෂ වෙනුවෙන් රැස්කළ ආදායම රු. 21,131,018 ක් විය. ඒ අනුව මුදල්	චක්‍රලේඛ උපදෙස් අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වීම හා ඒ අනුව ශේෂ පිරික්සුමේ අගයන් හා මුදල් ප්‍රවාහයේ අගයන් සමානවිය යුතු වීම.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ වෙනත් ශීර්ෂ වෙනුවෙන් රැස්කළ ආදායම රු.13,885,813 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව වෙනත් ශීර්ෂ වෙනුවෙන් රැස්කළ ආදායම රු.21,131,018 ලෙස දක්වා ඇත.

	ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 6,963,979 ක් අඩුවෙන් නිරූපණය වී තිබුණි.		
(ආ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අයකර ගැනීම රු. 452,413 ක් ලෙස දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 10,062,947ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 9,610,534 ක් අඩුවෙන් දක්වා තිබුණි.	ශේෂ පිරික්සුමේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අගයන් සමාන වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වීම.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අත්තිකාරම් අයකර ගැනීම රු. 452,413 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 10,062,947 ලෙස දක්වා ඇත.
(ඇ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පත් ලැබීම් ලෙස රු. 257,225 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 1,302,547 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය රු. 1,045,322 කින් අඩුවෙන් දක්වා තිබුණි.	- එම -	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ තැන්පත් ලැබීම් ලෙස රු.257,222 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 1,302,546 ලෙස දක්වා ඇත.
(ඈ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස රු. 230,937,450 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 248,176,053 ක් වූයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු. 17,238,603 කින් අඩුවෙන් දක්වා තිබුණි.	ශේෂ පිරික්සුමේ හා මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අගයන් සමාන වන පරිදි මූල්‍ය ප්‍රකාශන සකස් කළ යුතු වීම.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් ලෙස රු.230,937,449 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු.248,176,052 ලෙස දක්වා ඇත.
(ඉ)	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම හා වෙනත් අයෝජන අත්කර ගැනීම් ලෙස රු. 62,281,390 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු. 62,662,622 ක් වූයෙන් ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය රු. 381,232 ක් අඩුවෙන් දක්වා තිබුණි.	වැය කර ඇති සියලු වියදම් මූල්‍ය ප්‍රකාශන තුළ නියමිත පරිදි ඇතුළත් කළ යුතු වීම.	මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් ලෙස රු.62,281,389 ක් දක්වා තිබුණ ද ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව එම අගය රු.62,662,622 ලෙස දක්වා ඇත.

1.6.3 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
හානි පිළිබඳ ලේඛනය		
මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව පවත්වාගෙන යා යුතු හානි පාඩු පිළිබඳ ලේඛනයෙහි සමාලෝචිත වර්ෂයේදී සිදුවූ වාහන අනතුරු 3 කට අදාළව හානියේ වටිනාකම, අලුත්වැඩියා කිරීමට යන වියදම, අයකර ගත හැකි වටිනාකම යනාදී විස්තර ඇතුළත් කර හානි පාඩු ලේඛනය යවත්කාලීනව පවත්වා නොතිබුණි.	මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලීනව පවත්වා ගත යුතු වීම.	වාහන අනතුරු සම්බන්ධව අදාළ පරීක්ෂණ කටයුතු තවදුරටත් කෙරෙමින් පවතී.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
පුනරාවර්ථන වැයවිෂයන් 04 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 9 ක සිට සියයට 68 ක් දක්වා ඉතිරිවීම් පැවති අතර එම වැයවිෂයයන්ට අදාලව ඇස්තමේන්තු කිරීමේ දුර්වලතා සිදුවී ඇති බව නිරීක්ෂණය විය.	මුදල් රෙගුලාසි. 50 ප්‍රකාරව නිවැරදි වියදම් ඇස්තමේන්තු පිළියෙල කළ යුතු වීම.	අවශ්‍යතා ඇති නොවීමත් අපේක්ෂිත කාර්යයන් ඉටු නොවීමත් නිසා ප්‍රතිපාදන ඉතිරි වීම.

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) 2020 මැයි 31 දින වනවිට වවුචර්පත් මඟින් ගෙවීම් කර තිබූ රු.595,812 ක් වූ බැරකම් වාර්ෂික මූල්‍ය ප්‍රකාශනවල බැරකම් ලෙස සටහන් වී නොතිබුණි.	මුදල් රෙගුලාසි 150 ප්‍රකාරව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමඟ සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඇති සියලු බැරකම් හෙළිදරව් කළ යුතු වීම.	විගණන නිරීක්ෂණය නිවැරදියි.
(ආ) මුදල් රෙගුලාසි 94(1) ප්‍රකාරව බැරකම් හා බැඳීම්වලට එළඹීමේදී කිසිම විටෙක මුදල් වර්ෂය සඳහා ඇති ප්‍රතිපාදන නොඉක්මවිය යුතු නමුත් වැය විෂයන් 09 ක ප්‍රතිපාදන ඉක්මවා එකතුව රු.11,842,717 ක් බැරකම්වලට එළඹ තිබුණි.	මුදල් රෙගුලාසි ප්‍රකාරව බැරකම් ප්‍රමාණය එම වර්ෂයේ ප්‍රතිපාදනය නොඉක්ම විය යුතු වීම.	දෙපාර්තමේන්තුවේ ඒ වන විට පැන නැගුණු අවශ්‍යතා මත හා මු.රෙ.94(2) අනුව මෙම බැරකම්වලට එළඹීමට සිදුව ඇත.

2.3 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
එකතුව රු. 7,488,595 ක් වූ කල් ඉකුත් තැන්පතු මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව රාජ්‍ය ආදායමට බැර කිරීමට හෝ හැකි ඉක්මනින් ආපසු ගෙවීමට හෝ කොන්ත්‍රාත් තැන්පතු සම්බන්ධයෙන් වූ විට කොන්ත්‍රාත්තු වලින් වූ අලාභ ආපසු අයකර ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.	කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	කොන්ත්‍රාත්තුවේ පවතින ගැටළු හේතුවෙන් මෙම මුදල නිදහස් කර නොමැත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුව විසින් උපායමාර්ග 07 කට අදාළ ක්‍රියාකාරකම් 64 ක් ඉටු කළ යුතුව තිබුණත් ඉන් ක්‍රියාකාරකම් 06 ක් ඉටුකර නොතිබුණි.	සමාලෝචිත වර්ෂයේදී ඉටු කළයුතු කාර්යභාරයන් සැලසුම් කළ පරිදි ඉටු කළ යුතු වීම.	ත්‍රිමාණ සජීවීකරණ වැඩසටහන් රජයේ චිත්‍රපට අංශය මඟින් නිෂ්පාදනය කිරීමට ඉල්ලීම් නොලැබුන බැවින් එම වැඩසටහන් නිෂ්පාදනය කිරීම සිදු නොවූ අතර, දෙසතිය සඟරාවට සමගාමීව පල කිරීමට නියමිත තිංගල් දම්ළ මාධ්‍ය සඟරාව සඳහා සුදුසු කාර්ය මණ්ඩලයක් නොමැති වීමෙන් එය පල නොකිරීමට ප්‍රධාන හේතුවක් විය. පාසල් ජනමාධ්‍ය විෂය ගුණාත්මකව වර්ධනය කිරීම සඳහා විෂය භාර ආචාර්යවරුන්ගේ දැනුම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් පැවැත්වීමට නියමිතව තිබූ සම්මන්ත්‍රණය ද 2019 පාස්කු ප්‍රහාරය සමඟ ක්‍රියාත්මක කිරීමට නොහැකි විය.

3.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබූ ක්‍රියාකාරකම් 64 කින් රු.මිලියන 12.5 ක ප්‍රතිපාදන සලසා තිබූ ක්‍රියාකාරකම් 08 ක් අපේක්ෂිත නිමැවුම් මට්ටම අත් කරගෙන නොතිබූ අතර, එය සියයට 12 ක සිට සියයට 96 ක් දක්වා වූ පරාසයක් ගෙන තිබුණි.	සමාලෝචිත වර්ෂයේ ඉටු කළයුතු කාර්යභාරයන් සැලසුම් කළ පරිදි ඉටුකළ යුතු වීම.	දෙසතිය සඟරා - වාර්ෂික කලාප 24 න් 3ක් නොවැලැක්විය හේතුවක් නිසා මුද්‍රණය කිරීමට නොහැකි වීමත් එවකට පැවති රජය කැබිනට් තීරණ ප්‍රකාශයට පත්කිරීමේ ප්‍රවෘත්ති සාකච්ඡා අත්හිටු වීමත් පැවති දේශපාලන වාතාවරණය හා වර්ෂ අවසානයේ පැවති ජනාධිපතිවරණයත් පාස්කු ප්‍රහාරයත් ඇතැම් ක්‍රියාකාරකම් 2021 වර්ෂය සඳහා ක්‍රියාත්මක කිරීමට කල් දැමීමත් හේතු විය.

3.3 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) මාර්ගෝපදේශය ප්‍රකාරව ප්‍රසම්පාදන සැලැස්ම මාස හයකට වැඩි නොවන කාලයක් තුළදී නිතිපතා යාවත්කාලීන කළ යුතු වුවත් එසේ සිදුකර නොතිබුණි.	ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1(ඉ) අනුව ඉදිරියේදී කටයුතු කරන බව කාරුණිකව දන්වමි.
(ආ) ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.2 (අ) මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කරන අවස්ථාවේ සිට අවසන් කරන තුරු එක් එක් ප්‍රසම්පාදන ක්‍රියාවන්හි පියවරයන් ක්‍රමානුකූලව විස්තර කරමින් ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කළයුතු වුවද එසේ සකස් කර නොතිබුණි.	-එම-	ප්‍රසම්පාදන කාලසටහනද ඇතුළත් කරමින් ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කොට ඇත.

3.4 පාඩු හා හානි

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) 2019 වර්ෂයට අදාළව සිදු වූ වාහන අනතුරු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 හා 105 ප්‍රකාරව වගකිව යුත්තන් හඳුනා ගැනීම, අලාභ හානි සම්බන්ධව අය කර ගැනීම් සඳහා ක්‍රියාමාර්ග ගැනීම් ආදිය වෙනුවෙන් ප්‍රාරම්භක පරීක්ෂණයක් පවත්වා නොතිබුණි.	අනතුරක් සිදුවූ පසු හැකි ඉක්මනින් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	මෙම අනතුරු සම්බන්ධයෙන් අදාළ නිලධාරීන්ගෙන් සටහන් ලබා ගනිමින් පරීක්ෂණ කටයුතු ආරම්භ කර ඇති අතර, ඉදිරි කටයුතු කෙරෙමින් පවතී.

(ආ)	හිටපු අධ්‍යක්ෂ ජනරාල්වරයෙකුට නිකුත් කරන ලද ජංගම දුරකථනය හා උකුල් පරිගණකය 2020 නොවැම්බර් වන විටත් ආපසු භාරදී නොතිබුණු අතර, ඒවා 2014 හා 2015 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණ වාර්තාවල ඌනතාවයන් ලෙසද දක්වා තිබුණි.භාණ්ඩ බාර නොදී වර්ෂ 05 කට වැඩි කාලයක් ගත වී තිබුණ ද,එම නිලධාරියාට විරුද්ධව 2020 සැප්තැම්බර් වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.	අලාභය හෝ හානියේ වටිනාකම අදාළ නිලධාරියාගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතු වීම.	මෙම උපකරණ දෙපාර්තමේන්තුව වෙත නැවත භාරදීම සම්බන්ධයෙන් අදාළ නිලධාරියා සමඟ දුරකථනයෙන් සාකච්ඡා කරන ලද අතර, හැකි ඉක්මනින් එම උපකරණ නැවත දෙපාර්තමේන්තුව වෙත භාර දෙන බව නිලධාරියා පවසන ලදි.

3.5 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ) සේවය අතහැර ගොස් ඇති නිලධාරීන් දෙදෙනකුගෙන් අයකර ගත යුතු වර්ෂ 18 කට වඩා පැරණි රු.195,040 ක ණය ශේෂ 2020 ජුනි මාසය වන විටත් අය කරගැනීමට කටයුතු කර නොතිබුණි.	ණය ශේෂ අයකර ගැනීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ඡේදයේ 4 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතු වීම.	අප විසින් එකී සියලුම ලිපිවල පිටපත් 2020.02.24 දින රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර ඒ සඳහා අනුමැතිය ලැබුණු පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ඇත.
(ආ) වැඩ තහනම් කර ඇති නිලධාරියෙකුගෙන් අයකර ගත යුතු මාස 03 ට වඩා වැඩි රු.244,390 ක ණය ශේෂය 2020 නොවැම්බර් වන විටත් අය කරගෙන නොතිබුණි.	-එම-	විධිමත් විනය පරීක්ෂණයක් පවත්වා අවසන් තීරණයක් ලබාදෙන තෙක් 2020.03.19 දින සිට ක්‍රියාත්මක වන පරිදි අඩ වැටුප් ගෙවීම ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කර ඇති අතර, අඩ වැටුප් ගෙවීමේදී නිලධාරියාගේ ආර්ථික අපහසුතාද සැලකිල්ලට ගෙන වැන්දඹු අනත් දරු දායක මුදල්, අග්‍රහාර රක්ෂණ මුදල් සහ මුද්දර ගාස්තු පමණක් අයකර ඇත.

4. යහ පාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තිය හා මුදල් රෙගුලාසි 133 අනුව 2020 සැප්තැම්බර් වන විටත් දෙපාර්තමේන්තුව සඳහා අභ්‍යන්තර විගණකවරයෙකු පත්කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනත හා මුදල් රෙගුලාසි ප්‍රකාරව අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කිරීමට කටයුතු කළ වීම.	අභ්‍යන්තර විගණන තනතුරෙහි පුරප්පාඩුව රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය විසින් නිලධාරියකු පත්කර එවීම මඟින් සම්පූර්ණ කළයුතු වේ.

04 පරිච්ඡේදය

කාර්ය සාධන දර්ශක

කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම්		
	100% - 90%	**75% - 89%**	**50% - 74%**
තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන ප්‍රචාරණ වැඩපිළිවෙල පිළිබඳ තොරතුරු ජනතාව වෙත ගෙන යාම	-	86%	-
ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම	96%	-	-
මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම	-	-	63%
යහපාලනය, සංහිඳියාව,තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම	-	-	52%
වෘත්තීය මාධ්‍යවේදීන් බිහි කිරීම	-	-	64%
මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම	-	75%	-

05 පරිච්ඡේදය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු දක්වන්න

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය		
			0% - 49%	50% - 74%	75% - 100%
තිරසර සංවර්ධනය සඳහා ගෝලීය සහයෝගිතාවය නැවත බල ගැන්වීම හා ක්‍රියාත්මක කිරීම	තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම හා ඒ සම්බන්ධව පුළුල් අවබෝධයක් ලබා දීම	කැබිනට් තීරණ දැනුම් දීමේ මාධ්‍ය හමු පැවැත්වීම	-	55%	-
		පාසල් ජනමාධ්‍ය හමු පැවැත්වීම	48%	-	-
		සමාජ මාධ්‍ය (you tube, face book, twitter) ඔස්සේ ජනතාව දැනුවත් කිරීම	-	-	80%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග සැකෙවින් විස්තර කරන්න

තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ :

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව විසින් තිරසර සංවර්ධන අරමුණු සම්බන්ධව ජනතාව දැනුවත් කිරීම හා ඒ සම්බන්ධව පුළුල් අවබෝධයක් ලබා දීම වෙනුවෙන් You tube හා Face book යන සමාජ ජාලා භාවිතා කිරීම ආරම්භ කරන ලදී.

අභියෝග :

පවතින තරඟකාරී වටපිටාව තුළ සමාජ මාධ්‍ය තුළින් ජනතාවට නිවැරදි හා විශ්වසනීය තොරතුරු ඉක්මණින් ලබා දීම

06 පරිච්ඡේදය

මානව සම්පත් පැතිකඩ

මානව සම්පත් පැතිකඩ

06.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත) **
ජ්‍යෙෂ්ඨ	17	12	05
තෘතීයික	16	02	14
ද්විතියික	245	174	71
ප්‍රාථමික	53	41	12

*06.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.*

තෘතීයික මට්ටමේ සහ ද්විතියික මට්ටමේ මානව සම්පත් හිඟය දෙපාර්තමේන්තුවේ කාර්ය සාධනය උදෙසා සෘජුවම බලපා ඇත. විශේෂයෙන් තාක්ෂණික කාර්යභාරය ඉටු කරන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පැවතීම හේතුවෙන් දෛනික රාජකාරී කටයුතු ඉටු කර ගැනීමේදී අපහසුතාවයක් පවතී. එනම්, දෙපාර්තමේන්තු ගත තනතුරුවල සේවයේ යෙදී සිටි දැනුම සහ කුසලතාවයෙන් යුතු නිලධාරීන් විශ්‍රාම යාම ප්‍රධානම හේතුව වී ඇත. නවක නිලධාරීන්ට එම පුහුණුව ලබා දීමට විශාල කාලයක් ගත වනු ඇත. එසේම එම තනතුරුවල පුරප්පාඩු සඳහා උසස්වීම් ලබා දීමට ඇති බාධා හේතුවෙන් ද මේවන විට විවිධ මට්ටම්වල තනතුරු සඳහා නිලධාරී හිඟයක් ඇති වී තිබේ.

06.3 මානව සම්පත් සංවර්ධනය

වැඩසටහනේ නම	පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව	වැඩසටහනේ කාල සීමාව	සමස්ථ ආයෝජනය (RS'000)		වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය)	නිමැවුම/ ලබා ගත් දැනුම*
			දේශීය රු.	විදේශීය රු.		
පුහුණු පාඨමාලා	140	2019.01.01 දින සිට 2019.12.31 දින දක්වා කාල සීමාව තුළ	735,2000/-	-	දේශීය	ඒ, ඒ විෂයයන්ට අදාළව විෂය දැනුමක් ලබා ගැනීම
පුහුණු වැඩමුළු	01	2019.12.08 දින සිට 2019.12.15 දින දක්වා	-	68,700/- සහ 3,802.66 US $	විදේශීය	චිත්‍රපට සංරක්ෂණය ට අදාළ දැනුම ලබා ගැනීම

* **ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන් දායක වන්නේ කෙසේද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.**

රාජ්‍ය සේවයට නවක පත්වීම් ලද නිලධාරීන් අනුයුක්ත කර සිටින අංශවලට හා පවරනු ලබන රාජකාරීවලට අදාළව බාහිර ආයතන මඟින් නිසි පුහුණුවක් ලබා දීම තුළින් තම රාජකාරී නිවැරදිව, ක්‍රමානුකූලව හා කාර්යක්ෂමතාවයෙන් යුතුව ඉටු කිරීමට හැකියාව ලැබී ඇත. එසේම කාර්ය මණ්ඩල අභිප්‍රේරණයක් ළඟා කර ගැනීම මෙමඟින් අපේක්ෂිතය. නව දැනුම උකහා ගැනීමට හා දැනුම යාවත්කාලීන කර ගැනීමට අවස්ථාව සලසා දීම මඟින් දෙපාර්තමේන්තුවේ කාර්යසාධනය ඉහළ මට්ටමකට ගෙන ඒමට විශාල පිටුවහලක් වනු ඇතැයි අපේක්ෂා කරනු ලැබේ.

එසේම විද්‍යුත් පුහුණු සඳහා නිලධාරීන් යොමු කිරීම තුළින් දෙපාර්තමේන්තුවේ චිත්‍රපට අංශය යටතේ පවතින කටයුතු ඩිජිටල්කරණය කිරීම විධිමත් කිරීමට හැකියාව ලැබී ඇත.

එනම්, පැරණි චිත්‍රපට, වාර්තා චිත්‍රපට සංරක්ෂණය කිරීම සඳහා ඩිජිටල්කරණය කිරීම ආරම්භ වී ඇති අතර අනාගතයේදී මහජනතාවට / මාධ්‍යවේදීන්ට හෝ අවශ්‍ය වෙනත් කෙනෙකුට අවශ්‍ය අවස්ථාවන්වලදී පරිහරණය කිරීමට හෝ දැක බලා ගැනීමට අවස්ථාව ලබා දීමට අපේක්ෂිතය.

07 පරිච්ඡේදය

අනුකූලතා වාර්තාව

අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේදී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ	-	-
1.2	රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ	-	-
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්)	අදාළ නොවේ	-	-
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාළ නොවේ	-	-
1.6	වෙනත්	අදාළ නොවේ	-	-
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල නොවේ	රා.ගි.ව.අංක 271/2019 (මූල්‍ය ප්‍රකාශන - 2019) මඟින් තවදුරටත් එම ලේඛන පවත්වාගෙන යාම අත්‍යවශ්‍ය නොවන බව දන්වා ඇත	
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත්	අනුකූල වේ	-	-

	යාවත්කාලීන කර පවත්වාගෙන යාම			
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.2	මූල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ	-	-
3.3	සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ	-	-
3.4	2014.05.11 දිනැති 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ	-	-
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ	-	-
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අදාළ නොවේ	-	-
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය	අනුකූල වේ	-	-

	දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම			
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ	-	-
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල නොවේ	අභ්‍යන්තර විගණක තනතුරට නිලධාරියෙකු පත් කර නොමැත	-
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ	2019 වර්ෂයට විගණන විමසුම් ලැබී නොමැත	
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත්	අදාළ නොවේ		

	කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම			
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ	-	-
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	ආරම්භක ශේෂ ද ඇතුළුව සියළුම වත්කම් Cigas වැඩසටහනට ඇතුළත් කරන ලද්දේ 2020 පෙබරවාරි මස වේ	
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම, සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු	අනුකූල වේ	-	-

	පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම			
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල නොවේ	2019 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදු කොට තිබීම	අනුකූල නොවේ	2019 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල නොවේ	2019 වර්ෂයට අදාළ භාණ්ඩ සමීක්ෂණ කටයුතු කෙරෙමින් පවතී	
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ	-	-
9.2	වාහන ගර්හිත වී මාස 06කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	මේ සඳහා වන ක්‍රියාවලියට දිගු කාලයක් ගත වීම	භාවිතයෙන් ඉවත් කරනු ලබන වාහන නිවැරදිව හඳුනාගෙන අදාළ

				කටයුතු කඩිනමින් ඉටු කිරීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල නොවේ	සිදු වී ඇති, එහෙත් මේ වන විට පරීක්ෂණ පවත්වා නොමැති සියළුම වාහන අනතුරුවල පරීක්ෂණ පැවැත්වීමේ කටයුතු සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් පවතී	
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහනවල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ	-	-
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරා ගෙන තිබීම	අනුකූල වේ	-	-
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහ ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට	අනුකූල වේ	-	-

	ඉදිරියට රැගෙන ආ අක්‍රීය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම			
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ	-	-
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ	-	-
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල නොවේ	රජයේ අත්‍යවශ්‍ය ප්‍රචාරණ කටයුතු සිදු කිරීමට සිදු වීම හේතුවෙන් ප්‍රතිපාදන සීමාව ඉක්මවා බැරකම්වලට එළඹීමට සිදු වීම	වර්ෂ අවසාන ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීමට කටයුතු කිරීම
12	**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ	-	-
12.2	හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ	-	-

12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	නීතිපති උපදෙස් ඉල්ලා ඇති අතර, නීතිපති උපදෙස් ලැබුණු පසු ඉදිරි ක්‍රියාමාර්ග ගනු ලැබේ	ඉදිරියේදී නිසි කලට ණය ශේෂ නිරවුල් කිරීමට කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල නොවේ	මාධ්‍ය මධ්‍යස්ථාන ගොඩනැගිල්ලට අදාළ ගැටළු මේ දක්වා විසඳී නොමැත	රඳවා ගැනීම් මු.රෙ.ප්‍රකාරව නිදහස් කිරීමට කටයුතු කිරීම
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ	-	-
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ	-	-
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාරිය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ජනාධිපතිවරණය සඳහා කළ ගෙවීම් තව දුරටත් මැතිවරණ දෙපාර්තමේන්තුවේ ප්‍රතිපූර්ණය කර නොමැත	-

14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රීම නිකුත් කර තිබීම	අනුකූල වේ	-	-
14.4	අග්‍රීම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ	-	-
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ	-	-
15.2	රැස් කර තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ	-	-
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අදාළ නොවේ	-	-
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයින් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල නොවේ	දැනට පාලන හා ගිණුම් අංශවල නිලධාරීන්ට පමණක් ලබා දී ඇති අතර, ඉදිරියේදී දෙපාර්තමේන්තුවේ සියලුම අංශයවල නිලධාරීන්ට ලබා දීමට සාකච්ඡා කරමින් පවතී	

16.3	2017.09.20 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා, කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ	-	-
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා / චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ	-	-
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ	-	-

18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කිරීම	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ	
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ	
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී සකස් කිරීමට බලාපොරොත්තු වේ	
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන්	අනුකූල වේ	-	-

	මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම			
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී ගිවිසුම් අත්සන් කර ගැනීමට කටයුතු කරනු ලැබේ	
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම	අනුකූල නොවේ	ඉදිරියේදී වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු සකස් කිරීමට බලාපොරොත්තු වේ	
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මඟින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල නොවේ	විගණන ඡේද කිහිපයකට අදාළ ක්‍රියාමාර්ග අවසාන වී නොමැත	අදාළ කටයුතු කරමින් පවතී

අවසානය :

රාජ්‍යප්‍රතිපත්ති,රජයේසංවර්ධනක්‍රියාදාමයඇතුළුවජාතිකවැදගත්කමකින්යුතුකාලීනක්‍රියා කාරකම්සහජනතාවවෙනුවෙන්රජයමගින්ඉටුකරනුලබනකාර්යභාරයපිළිබඳවමහජනතාවදැනුව ත්කිරීමමෙමදෙපාර්තමේන්තුවේප්‍රධානවගකීමහාකාර්යභාරයවනඅතර වෙනස්වනගෝලීයතාක්ෂණප්‍රවණතාවයන්වලටඅනුගතවෙමින්තොරතුරුතාක්ෂණක්‍රියාවලියකළ මනාකරණයකර,නිදහස්භාවගකිවයුතුඋසස්මාධ්‍යසංස්කෘතියක්ගොඩනැගීමසඳහා අනුබල දීම හා නායකත්වය සැපයීමද ප්‍රධාන අභිමතාර්ථයන් වේ.

මෙකීකාර්යභාරයසාක්ෂාත්කරගනුවස්,එනම්, යහපත් මාධ්‍ය සමාජයක් ගොඩනැඟීම සඳහා අවශ්‍ය වන්නා වූ පසුබිම ලාංකේය සමාජය තුළ ස්ථාපිත කිරීමට උපයෝගී කර ගනු ලබන ප්‍රතිපත්ති සැකසීම, දෙපාර්තමේන්තු කාර්ය මණ්ඩලය පාලනය, අමාත්‍යාංශ සහ අනෙකුත් රාජ්‍ය සහ පෞද්ගලික ආයතන සමඟ රාජකාරීමය සම්බන්ධතා පවත්වාගෙන යාම ආදිය සඳහා දෙපාර්තමේන්තුවසියකාර්යමණ්ඩලයමෙහෙයවනඅතරඑහිදීඑකීනිලධාරීන්ටසියවගකීම්ඉටුකරගැ නීමටඅවශ්‍යකරනදැනුම,හැකියාවහාපරිසරයසකස්කරදෙනුලබයි.

මේ තුළවැඩිඅවධානයක්දෙපාර්තමේන්තුවපිහිටුවීමේමූලික අරමුණුකෙරෙහියොමුකෙරෙනඅතර,දෙපාර්තමේන්තුවේසියළුමඅංශඑකීඅරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිසමක්‍රියාත්මකවේ.

රජයේසංවර්ධනපුවත්ජනතාවවෙතසම්ප්‍රේෂණයකිරීමේභූමිකාවමෙන්මඒහාඇඳුනුතවත්අ රමුණුසාක්ෂාත්කරගනුවස්ක්‍රියාත්මකරජයේප්‍රවෘත්තිදෙපාර්තමේන්තුව,ඒවෙනුවෙන්විවිධක්‍රියාකා රකම්සියසැලසුම්තුළඅන්තර්ගතකරවසරමුලදීඑකීසැලසුම්සඳහාඅමාත්‍යාංශඅනුමැතියලබාගනී.

ඉන්අනතුරුව වසර පුරා එකී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ ක්‍රියාකාරකම්වල නිරත වන අතරඑමඟින් සාක්ෂාත් කර ගැනීමට වෙර දරන අරමුණු මූලික වශයෙන් පහත පරිදි පෙළගැස්විය හැක.

- ප්‍රමිතිගත මාධ්‍ය සම්ප්‍රදායක් ඇති කිරීම
- තොරතුරු දැන ගැනීමේ අයිතිය ප්‍රවර්ධනය කිරීම සඳහා රජයේ සංවර්ධන වැඩසටහන් වැඩපිළිවෙල පිළිබඳ තොරතුරු ජනතාව වෙත ගෙන යාම
- මාධ්‍ය විමර්ශන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම

- යහපාලනය, සංහිඳියාව, තිරසාර සංවර්ධනය ස්ථාපිත කරමින් ප්‍රකාශනයේ හා භාෂණයේ නිදහස තහවුරු කිරීම
- මාධ්‍ය ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ කටයුතු, සංවර්ධන හා සැලසුම් ඇති කිරීම

ඉහතඅරමුණුසාක්ෂාත්කරගනුවස්,දෙපාර්තමේන්තුවවිසින්ක්‍රියාත්මකකරනුලබනප්‍රධානක්‍රියාකාරකම්පහතපරිදිවර්ගකළහැක.

- අනෙකුත්අමාත්‍යාංශවිසින්ඉටුකරනුලබනකාර්යයන්ටඅදාලදැනුවත්කිරීමේවැඩසටහන් (මාධ්‍යවේදීන්,පාසල්සිසුන්,මාධ්‍යලේකම්වරුන් හා අනෙකුත් පාර්ශව)
- මාධ්‍යසාකච්ඡාසංවිධානයකිරීම (කැබිනට්තීරණදැනුම්දීමේ මාධ්‍ය සාකච්ඡාව හා වෙනත්අමාත්‍යාංශහාආයතනකාර්යභාරයටඅදාලව)
- ප්‍රවෘත්තිනිවේදනනිකුත්කිරීම
- මාධ්‍යනිරීක්ෂණචාරිකාසංවිධානයකිරීම
- සංවර්ධනවැඩසටහන්පිළිබඳලිපිහාප්‍රකාශනප්‍රකාශයටපත්කිරීම
- නවමාධ්‍යයොදාගෙනසංවර්ධනවැඩසටහන්පිළිබඳප්‍රචාරණයලබාදීම(Face Book, You Tube, Twitter etc….)
- දෙස්විදෙස්මාධ්‍යවේදීන්සඳහාමාධ්‍යහඳුනුම්පත්නිකුත්කිරීම
- දෛනික විමර්ශන වාර්තා සකස් කිරීම හා අවශ්‍යතාවය මත අදාල අංශ දැනුවත් කිරීම
- කාලීන වශයෙන් වැදගත් මාතෘකා හා මාධ්‍ය ක්ෂේත්‍රයේ නව ප්‍රවණතා සම්බන්ධයෙන් පර්යේෂණ කිරීම හා වාර්තා ඉදිරිපත් කිරීම
- වාර්තාචිත්‍රපටනිෂ්පාදනයහාප්‍රචාරය
- ජාතිකඋත්සවහාසංරක්ෂණයකළයුතුඅවස්ථාවන්ආවරණය හා එකී අවස්ථාඡායාරූප ගැනීම, සංරක්ෂණය

මෙලෙස විවිධාකාර භූමිකා හා අරමුණු ඔස්සේ රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව තම දෛනික රාජකාරී කටයුතු වඩා කාර්යක්ෂමතාවයෙන් සහ රාජ්‍ය ප්‍රතිපත්ති හා අරමුණු ඉටු කර ගැනීමට මනා පිටුබලයක් වෙමින් ඉදිරි වර්ෂය සඳහා ද ක්‍රියාත්මක වනු ඇත.

රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව,
163, කිරුළපන ඇවනිව්, පොල්හේන්ගොඩ, කොළඹ 05.

அரசாங்க தகவல் திணைக்களம்
இல.163, கிருலப்பனை மாவத்தை, பொல்ஹேன்கொடை, கொழும்பு 05.

Department of Government Information
No.163, Kirulapone Avenue, Polhengoda, Colombo 05

www.dig.gov.lk www.news.lk